# 19. නිවැරදි දැක්ම තුළින් ජීවිත නවෝදය

**ජේසුස් වහන්සේ ව්‍යාපිට සේවය ආරම්භ කිරීමට පෙර, පැහැදිලි අවබෝධයක් ලැබ, පියවර ගත් ආකාරය පසුගිය පාඩමෙන් අපි වටහා ගතිමු. උන්වහන්සේගේ සේවා කාලය පුරාම දුන්නා වූ අනුශාසනා, කළ දේශනා, සිදුකළ දෑ හොඳාකාරව අත්දුටුවේ උන්වහන්සේ විසින්ම කැඳවා පුහුණු කළ ප්‍රේරිත කණ්ඩායම ය. ස්වකීය මෙහෙය නිමා වීමට ආසන්නව තමන්වහන්සේ පිළිබඳ ව නිවැරදි අවබෝධයක් ශ්‍රාවකයන් තුළ තහවුරු කිරීමට අවස්ථාව එළඹ තිබුණි. එම අවස්ථාව හා සම්බන්ධ සිද්ධිය මෙම පාඩම තුළින් අවබෝධ කර ගැනීමට දැන් යොමු වෙමු.**

ශු. ලූක් 9: 28-36

ජුදෙව් සමාජය තුළ දේව රාජ්‍යය ගොඩ නැගීමේ කාර්යය ජේසුස් වහන්සේ දියත් කළ විට උන්වහන්සේ පිළිබඳ විවිධ අදහස් ප්‍රචලිත විය. එවිට ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන් විමසුවේ උන්වහන්සේ කවුරු ද කියා ඔවුන් සිතන්නේ ද යනුවෙනි. ශ්‍රාවකයන් වෙනුවෙන් සීමොන් පේදුරු කළ මහා ප්‍රකාශය (ශු. ලූක් 9: 18-20) කියවා බලන්න.

ගලීලයේ මුහුදේ ඇති වූ කුණාටුව ජේසුස් වහන්සේ සංසිඳ වූ අවස්ථාවේ එය අත්දුටු ශ්‍රාවකයන් මවිතයට පත් ව උන්වහන්සේ කව්දැයි යන ප්‍රශ්නය මතුවිය. ජේසුස් වහන්සේ යාච්ඤාව හා භාවනාව සඳහා නිතර වැඩම කළේ නිසල පරිසරයකට ය. දිනක් උන්වහන්සේ පේදුරු, ජාකොබ් හා ජොහාන් සමග යාච්ඤා කරන පිණිස කන්දකට නැගුණු සේක. එම ස්ථානයේ සිදු වූ දේ කියවා බලමු.

ශු. ලූක් 9: 28-36
රූප විපර්යාසය/අන්වෙසක් වීම

මෙය අපගේ ජේසුස් වහන්සේගේ ජීවිතයේ ඉතා වැදගත් සිද්ධියකි. සත්‍යතාවයේ ආලෝකයාණන් අනාවරණය වූ අවස්ථාවකි. මූලික ශ්‍රාවකයන් තිදෙන දර්ශනය කළ ජීවමාන අත්දැකීමකි. ජේසුස් වහන්සේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශ්‍රාවකයන්ගේ සාක්ෂි දැරීමේ පදනම වූයේ මෙම අත්දැකීම ය.

**මෙම අවස්ථාවේ අනාවරණය වූ විශේෂ සිද්ධිය වෙත යොමු වෙමු.**

| | |
|---|---|
| ❊ ජේසුස් වහන්සේ කන්දකට නැග යාච්ඤාවේ යෙදී සිටිය දී | උන්වහන්සේගේ මුහුණවර වෙනස් විය |
| ❊ ජේසුස් වහන්සේගේ වස්ත්‍ර | ධවල කාන්තියෙන් බැබලිණි. |
| ❊ ජේසුස් වහන්සේගේ දෙපස | මෝසෙස් සහ එළියා තේජශ්‍රීයෙන් වැඩ සිටියහ |
| ❊ මෝසෙස් හා එලියා ජේසුස් වහන්සේ සමග කළ සාකච්ඡාව | ජෙරුසලමේ දී ජේසුස් වහන්සේ විසින් ඉටු කිරීමට නියමිත ජීවිත පූජාව ගැන වේ |
| ❊ නිදිබර ව සිටි ශ්‍රාවකයන් තිදෙනා අවදි වීම | ජේසුස් වහන්සේගේ තේජශ්‍රීය ද, මෝසෙස් හා එළියා උන්වහන්සේ සමග වැඩ උන් ආකාරය සියැසින් ම දුටහ |
| ❊ මෝසෙස් හා එලියා දර්ශනය වීමේ පරමාර්ථය | ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණ වූ බව අනාවරණය වීම |
| ❊ ශ්‍රාවකයන් තිදෙන දේව ප්‍රකාශය ශ්‍රවණය කිරීම | නිවැරදි අවබෝධය. |

ජේසුස් වහන්සේගේ මුහුණු වර වෙනස්වීම, වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීම, උන්වහන්සේගේ තේජශ්‍රීය ප්‍රකාශිත සංකේතයන් ලෙස තේරුම් ගත හැක.

එලියා, දිවැසිවරයන් අතර ප්‍රධානියා ලෙස සංකේතවත් විය. මෝසෙස් ව්‍යවස්ථාවලිය පිළිබඳ ප්‍රධානියා ලෙස ජුදෙව්වන්ගේ පිළිගැනීම විය. එහෙයින් මෙම අවස්ථාව ව්‍යවස්ථාව හා දිවැසාවලිය සම්පූර්ණ වීම ජේසුස් වහන්සේ තුළින් සිදුවිය යුතු බව ශ්‍රාවකයන්ට ප්‍රකාශ විය. මොවුන් දෙදෙනා ජේසුස් වහන්සේ සමග කථා කරමින් සිටියේ උන්වහන්සේ ජෙරුසලමේ ඉටු කරන්නට යන ජීවිත පූජාව ගැන ය.

වලාපටලය ශු බයිබලයේ නිතර සංකේතවත් කෙරෙන්නේ දේව අභිමුඛත්වය යි. එහෙයින් ශ්‍රාවකයන්ට ජේසුස් වහන්සේ ගේ දේවත්වය වටහා ගැනීමට අවස්ථාව ලැබුණි.

දෙවියන් වහන්සේගේ හඬ මගින් මෙය තවදුරටත් තහවුරු වූ සේක. "මේ මාගේ පුත්‍රයාණෝ ය. මේ මා තෝරාගත් තැනැත්තාණෝ ය. මොහුට සවන් දෙන්න" ශ්‍රාවකයන්ට මෙම සත්‍ය ප්‍රකාශය මගින් ජේසුස් වහන්සේ දේව පුත්‍රයාණන් බව තහවුරු විය.

රූප විපර්යාසයේ තේජශ්‍රීය අත්දුටු ශ්‍රාවකයන් තිදෙනාට අවශ්‍ය වූයේ මණ්ඩප තුනක් තනා කඳු මුදුනේ රැඳී සිටීමට ය. එහෙත් ජේසුස් වහන්සේ ඔවුනට අවධාරණය

කළේ තමන් වහන්සේගේ මෙලොව සේවය සම්පූර්ණ වීමට ජෙරුසලමට යා යුතු බව යි. මනුෂ්‍යයාගේ පාපය උදෙසා දිවි පුද කළ යුතු බවත් ය. අනාගතයේ දී සිදුවන්නට නියමිත උන්වහන්සේගේ ජීවිත පූජාව ස්ථිර කළේ මෙම සිද්ධියෙනි. මෙම සිද්ධිය ශු. ලියවිලි තුළ කියවීමෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට මග පෙන්වීමකට අප යොමු වේ.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ ශ්‍රාවකයන් ලත් අත්දැකීම සත්‍ය ආනාවරණයකි. උන්වහන්සේ ආලේපලත් මෙසියස් වරයාණෝ ය. උන්වහන්සේ අපගේ ගැලුම්කරුවාණෝය. ඇදහිල්ලෙන් උන්වහන්සේ අදහා ගැනීමට අප බැහැපත් විය යුතු වේ. ජීවමාන ජේසුස් වහන්සේ පිළිබඳ නිවැරදි දැක්ම තුළ අපගේ ජීවිත ආලෝකවත් වේ. එබැවින් උන්වහන්සේගේ අනුගාමිකයන් ලෙස ලොවට ආදර්ශයක් විය හැකි ය.

ක්‍රියාකාරකම

1. ජේසුස් වහන්සේ කන්ද මත යෙදී සිටිය දී ශ්‍රාවකයන් තිදෙනා දුටු රූප විපර්යාසය කෙටියෙන් ලියන්න.

2. ශ්‍රාවකයන් ලත් නිවැරදි අවබෝධය අනුව ජේසුස් වහන්සේ පිළිබඳ ව ඔබගේ විශ්වාසය කුමක් ද ?